# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1272 / 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2023 திகதி

දිනය / Date: 08/10/2023 පැය 1230

## මාධ්‍ය නිවේදනය

### 01. ද්විත්ව මනුෂ්‍ය ඝාතනයක් - මාතර පොලිස් වසම.

2023.10.07 වන දින උදෑසන කාලයේ මාතර පොලිස් වසමේ ප්‍රීති බ්‍රවුන්සිල් ප්‍රදේශයේ නිවසක මෙහෙකාරියන් ලෙස සේවය කල කාන්තාවන් දෙදෙනෙකු ඝාතනය කර ඇති බවට මාතර පොලිසියට ලද දුරකථන පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරියන් අවුරුදු 67 හා 70 වයස් වල පසු වූ මාලම්බඩ හා වල්ගම ප්‍රදේශ වල පදිංචිකාරියන් වේ.**

එම නිවසේ හිමිකාරිය උදෑසන කාලයේ නිවසින් පිටව ගොස් නැවත සවස් කාලයේ නිවසට පැමිණි අවස්ථාවේ නිවසේ සිටි මෙහෙකාරියන් දෙදෙනා නොසිටි බැවින් ඇය ඔවුන්ගේ නමින් ආමන්ත්‍රණය කරමින් සොයාබලා ඇත. එහිදී වැඩිදුරටත් සොයා බැලීමේදි නිවසේ පිටුපස දොර විවෘත කර තිබී ඇති අතර මෙහෙකාරියන් නිවසේ නොසිටීම සම්බන්ධයෙන් අසල්වැසියන් දැනුවත් කර පොලිසියට දන්වා ඇත. පොලිසිය පැමිණ සිදුකරන ලද විමර්ශනයේදී මෙහෙකාරියන් භාවිතා කරනු ලබන වැසිකිලිය සහ නාන කාමරය තුල එම කාන්තාවන් දෙදෙනා ඝාතනය කර ඇති බවට නිරික්ෂණය වීමෙන් පසුව වැඩිදුරටත් පරික්ෂා කිරීමේදී නිවසේ කාමරයක අල්මාරියේ තිබූ රත්‍රන් නොවන වළලු 12 ක්, මාල 02 ක්, රන් පැහැති හැදි 01 ක්, විදේශ මුදල් කාසි 39 ක් ඇතුළු දේපල සොරාගෙන ගොස් ඇති බවටද අනාවරණය කරගෙන ඇත.

සිද්ධියට සම්බන්ධ වයස අවුරුදු 25ක් වන තුඩාව, මාතර ප්‍රදේශයේ පදිංචි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර සොරකම් කරන ලද දේපලද සැකකරු සන්තකයේ තිබියදී පොලිස් භාරයට ගෙන ඇත.

මහේස්ත්‍රාත් පරික්ෂණය සඳහා මෘත ශරීර සිද්ධිය වූ ස්ථානයේ ඇති අතර මාතර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

**02.** **සැකකටයුතු මරණයක් - කටාන පොලිස් වසම.**

2023.10.07 වන දින සවස් කාලයේ කටාන පොලිස් වසමේ කඳවල ප්‍රදේශයේ පිහිටි පොල් ඉඩමක මුරකරු ලෙස සේවය කල පුද්ගලයෙකු එම ඉඩමේ සැකකටයුතු ලෙස මියගොස් ඇති බවට කටාන පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 46 ක් වන කඳවල, කටාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මහේස්ත්‍රාත් පරීක්ෂණය කිරීමෙන් පසු පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කිරීම මෘත ශරීරය මීගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කටාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03.** **නීති විරෝධි මත්පැන් හා මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පමුණුගම පොලිස් ස්ථානය.**

2023.10.08 වන අද දින උදෑසන කාලයේ පමුණුගම පොලිස් වසමේ නුගපේ මුතුරාජවෙල වගුරුබිමේදී පමුණුගම පොලිස් ස්ථානයේ නිලධාරින් විසින් නීති විරෝධී මත්පැන් ලීටර් 101 මිලි ලීටර් 250 ක් (බෝතල් 135) හා මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 1512 ක් (බැරල් 08) ක්ද සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 56 ක්වූ කලඑළිය, ජා ඇල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පමුණුගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**04.** **රිය අනතුරක් - අඹන්පොල පොලිස් වසම.**

2023.10.07 වන දින රාත්‍රී කාලයේ අඹන්පොල පොලිස් වසමේ අනුරාධපුර කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ නැලැව හන්දිය අසලදී පාදෙනිය සිට අනුරාධපුර දෙසට ධාවනය කළ ලොරි රථයක රියදුරුට නින්ද යාම හේතුවෙන් ලොරි රථය මාර්ගයෙන් ඉවතට පැන අසල තිබූ ගසක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ලොරි රථයේ ගමන් ගත් පුද්ගලයින් 10 දෙනෙකු තුවාල ලබා ගල්ගමුව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු වැඩිදුර ප්‍රතිකාර සඳහා කුරුණෑගල හා අනුරාධපුර රෝහල් වෙත මාරුකර යවා ඇත.

අඹන්පොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**